www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල රැස්වීම ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත්-සෝවියට් ගුරුකුලය සාකච්ඡා කරයි

**Sri Lankan university meeting discusses: *Leon Trotsky & the Post-Soviet School of Historical Falsification***

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2008 සැප්තැම්බර් 12**

විශ්වවිද්‍යාල සිසුන්, දේශකයන් හා සේවකයන් 40ක පමන පිරිසක් ලියොන් ට්‍රොට්ස්කි හා ඓතිහාසික මුසාකරනයේ පශ්චාත්-සෝවියට් ගුරුකුලය නම් ග්‍රන්ථය සාකච්ඡා කරනු වස් අගොස්තු 27 දා ශ්‍රී ලංකාවේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ පැවති රැස්වීමකට සහභාගි විය. සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සමග ඒකාබද්ධව විශ්වවිද්‍යාලයේ දර්ශන සංගමය එම රැස්වීම සංවිධානය කලේ ය.

එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික සභාපති ඩේවිඩ් නෝර්ත් විසින් රචිත මෙම ග්‍රන්ථය පසුගිය වසරේ ප්‍රකාශයට පත් කරන ලද අතර එය ජෙෆ්රි ස්වේන් හා ඉයන් ඩී. තැචර් යන ශාස්ත්‍රාලිකයන් දෙදෙනා විසින් මෑතක දී ලියන ලද ලියොන් ට්‍රොට්ස්කිගේ චරිතාපදානවල අඩංගු ඓතිහාසික මුසාකරනයන් විභාගයට ලක් කරයි.

දර්ශන සංගමයේ ආරාධනය පරිදි, සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ප්‍රධාන ලේකම් විජේ ඩයස් සාකච්ඡාවේ ආරම්භක දේශනය පැවැත්වී ය. පසුගිය නෝර්ත්ගේ ග්‍රන්ථය වනාහි ශත වර්ෂය පුරා කම්කරු පන්තිය මුහුන දුන් අත්දැකීම්වල ප්‍රධාන පාඩම්වලින් සමාජවාදී සටන්කරුවන්ගේ නව පරම්පරාවක් සන්නද්ධ කරනු වස් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගෙන ගිය දේශපාලන අරගලයේ නිෂ්පාදිතයක් බව පැහැදිලි කරමින් ඔහු සිය කතාව ආරම්භ කලේ ය.

“වත්මන් කාල පරිච්ඡේදය තුල විප්ලවවාදීන් අනුගමනය කල යුතු වෛෂයිකව අවශ්‍ය දේශපාලන මාවත ආලෝකමත් කරනු වස් අත්‍යවශ්‍ය මෙම ඉතිහාසය අවබෝධ කර ගැනීමේ දී එම අරගල තුල දී ට්‍රොට්ස්කි සිදු කල න්‍යායික හා දේශපාලන කාර්ය භාරය කේන්ද්‍රීය වැදගත්කමක් දරන” බව ඩයස් පැවසී ය.

ස්වෙන් හා තැචර් යන විශ්වවිද්‍යාල මහාචාර්යවරු දෙදෙනා විසින් රචිත චරිතාපදාන ශිෂ්‍ය පාඨකත්වයකට පැහැදිලිව ම ඉලක්ක කෙරුනු බව, නෝර්ත්ගේ රචනාවෙන් උපුටා දක්වමින් ඩයස් පැහැදිලි කලේ ය. නෝර්ත් සඳහන් කල පරිදි: “තම පාඨකයන් බොහෝ දෙනෙකුට ට්‍රොට්ස්කි පලමු වරට හමුවනවා ඇත්තේ මෙම පොත් තුලින් බව කර්තෘවරු සත්තකින් ම දැන සිටිති. ඔවුන් මෙම පොත් දෙක තනා සකසා ඇත්තේ පාඨකයන් තුලින් අදාල විෂය පිලිබඳ වැඩිදුර උනන්දුව අකාමකා දැමීමට ඉවහල් වන පරිදි ගනන් බලා ය. මහාචාර්ය ස්වේන් ඔහුගේ වෙලුමෙහි පලමු වන ඡේදයෙහි නොසැඟවුනු තෘප්තියකින් නිවේදනය කොට තිබෙන පරිදි ‘මෙම චරිතාපදානය කියවන්නන් ට්‍රොට්ස්කිවාදය කරා නම් මග සොයා ගනු නැත.’”

මෙම විකෘත චරිතාපදාන දෙක පල කිරීම, වඩා පුලුල් දේශපාලන සන්දර්භයක තැබිය යුතු බව ඩයස් පැවසී ය. ලෝක ධනවාදය තුල සිදු කෙරී ඇති ගෝලීය ආර්ථික ප්‍රතිව්‍යුහකරනය, ජාතික ප්‍රතිසංස්කරනවාදී ක්‍රියාමාර්ගය මත පාදක වූ සියලු පක්ෂවල හා සංවිධානවල කඩා වැටීම මගින් ආදර්ශනය කෙරී ඇති ගැඹුරට විහිදුනු දේශපාලන අර්බුදයක් නිර්මානය කර ඇත. “ට්‍රොට්ස්කිවාදයේ ආනුභාවය යලි පැන නැගීමට පෙරාතුව කල්බලා එල්ල කරන ලද කිසියම් වර්ගයක පූර්වභංගික ප්‍රහාරයක්” ලෙස එම චරිතාපදාන දෙක ගුනාංගීකරනය කරමින්, නෝර්ත් මෙසේ පැහැදිලි කර තිබුනි: “එක්තරා මොහොතක දී පන්ති පන්ති ඝට්ටනය උග්‍රවීම බුද්ධිමය හා දේශපාලන ප්‍රකාශනයක් අත්කර ගනු ඇත. වත්මන් පවත්නා තත්වයට විකල්පයන් සෙවීම ඉස්මත්තට එනු ඇත. මෙය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය සහ අතීත විප්ලවවාදී අරගලවල ඉතිහාසය පිලිබඳ යලිත් පන නංවා වර්ධනය කරනු ද ඇත. එවන් වාතාවරනයක් වැඩී ඒම ලියොන් ට්‍රොට්ස්කිගේ ජීවිතය සහ වැඩකටයුතු පිලිබඳ අලුතින් වැඩුනු උනන්දුවකට මග පාදනු සහතික ය.”

1991 දී ස්ටැලින්වාදී නිලධරය සෝවියට් සංගමය බිඳ විසුරුවා හැරීමෙන් අනතුරුව ධනේශ්වර කව තුල හටගත් ජයොන්මාදයේ රැල්ල පිලිබඳ ඩයස් අවධානය යොමු කලේ ය. එහි දි අටුවාකරුවන් ප්‍රකාශ කර තිබුනේ ඉතිහාසයට ධනවාදය ඉක්මවා ඉදිරියට යා නොහැකි බව සහ සෝවියට් ක්‍රමය ආරම්භයේ පටන් ම විනාශයට

නියමිතව තිබූ බව යි. ස්වෙන් හා තැචර් විසින් ද වැලඳගනු ලැබූ මෙම විශ්ලේෂන විධික්‍රමයේ පවත්නා අති මූලික වරද නෝර්ත් හඳුනාගෙන ඇතැයි ඩයස් පැහැදිලි කලේ ය. ස්ටැලින්වාදය 1917 ඔක්තෝබර් විප්ලවයේ මිනීවල හාරන්නා ලෙස පැහැදිලිව ම හඳුනාගෙන ජාත්‍යන්තර සමාජවාදයේ ක්‍රියාමාර්ගය මත පාදකව විප්ලවයේ ජයග්‍රහන ආරක්ෂා කරගනු වස් ස්ටැලින්වාදයට එරෙහිව වීරෝධාර ලෙස සටන් වැදුනු සමාජවාදී විපාර්ශ්වයක් පැවතියේ ය යන කරුන ඔවුහු ඓතිහාසික වාර්තාවෙන් අකාමකා දැමී ය.

නෝර්ත්ගෙන් උපුටා දක්වමින් ඩයස් මෙසේ ප්‍රශ්නය මතු කලේ යඃ "සෝවියට් සංගමය එහි 74 හැවිරිදි ඉතිහාසයේ විවිධ ස්ථානවල දී වෙනස් පිලවෙත් අනුගමනය කලේ නම් එමගින් මීට අර්ථභාරී ලෙස වෙනස් ඓතිහාසික ප්‍රතිඵලයක් ජනනය වීමට හැකියාවක් නො තිබුනේ ද ?" සෝවියට් සංගමය තුල විකල්පයන් අනිවාර්‍යයෙන් ම පැවතියේ ය යන කරුන අවධාරනය කරනු වස් ඔහු ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ ඉතිහාසය සමග වැදගත් සමාන්තරයක් ඇද පෙන්වී ය.

"අනුප්‍රාප්තික ධනපති ආන්ඩුව විසින් ගෙන යන ලද සිවිල් යුද්ධයක ද ලංකා සමසමාජ පක්ෂය (ලසසප) ඇතුලු වමේ පැරනි පක්ෂවල කඩාවැටීමේ ද කොන්දේසි යටතේ හැදී වැඩී ඇති වත්මන් ශිෂ්‍ය පරම්පරාව, මීට හරියට ම වසර 55කට ඉහත දී 1953 අගෝස්තුවේ දී මේ රට තුල විප්ලවවාදී පරිමානයන් අත්කර ගත් අරගලයක් පැන නැගි බව බොහෝ විට නොදන්නවා විය හැකී" යයි ඩයස් පැහැදිලි කලේ ය." එය හැඳින්වූයේ හර්තාලය යන නමිනි, එනම්, ගම්බද ජනයාගේ සහයෝගය ලැබුනු කම්කරු පන්තියේ මහා වැඩ වර්ජනයකි. එම අරගලය සමස්ත ධනපති පාලනයට ම ඇනහිටවූ අතර එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව කඩා වැටීමේ අද්දරට ම ගෙන ආවේ ය.

"එම සුවිශේෂී අවස්ථාවේ දේශපාලන බලය ගැනීමේ හැකියාවක් කම්කරු පන්තියට තිබුනේ ද යන වග විවාදයට කරුනකි. එහෙත් ධනපති සමාජයේ ප්‍රධාන පන්ති දෙක වන ධනේශ්වරයේ හා කම්කරු පන්තියේ දේශපාලන පක්ෂ විසින් එම අරගලයෙන් උකහා ගනු ලැබූ පාඩම් සැලකිල්ලට ගැනීම වැදගත් ය. ජාතික රාජ්‍යයට හා පාර්ලිමේන්තු දේශපාලනයට අනුගත වෙමින් සිටි ලසසප තීන්දු කලේ ධනපති සංස්ථාපිතයට අභියෝග කරන කිසිදු අරගලයක යලි නිරත නොවන බවට යි. ධනේශ්වරය තීන්දු කලේ, දෙමල සුලුතරයට එරෙහිව සිංහල වර්ගවාදය අවුලුවමින්, බෙදා පාලනය කිරීමේ පිලිවෙත වඩා දෘඩතර ලෙස අනුගමනය කල යුතු බව යි. සිංහල එකම රාජ්‍ය භාෂාව බවට පත් කිරීමේ පිලිවෙත ධනේශ්වර දේශපාලනයේ හරි මැදට ගෙන එන ලදි.

"අප රුසියානු ඉතිහාසය සමග සන්සන්දනයක් කල හොත්, අපට කිව හැක්කේ 1953 හර්තාලය රුසියාවේ 1905 විප්ලවයට, එනම් 1917 ජයග්‍රාහී ඔක්තෝබර් විප්ලවයේ පෙර හුරුවකට, සමාන බව යි. 1905 අත්දැකීම්වලින් සහ එහි ලෝක සන්දර්භය පරීක්ෂාවට ලක් කිරීමෙන්, ට්‍රොට්ස්කි, නොනවතින විප්ලවය න්‍යාය විස්තාරනය කලේ ය. ඒ, ගොවි ජනතාවගේ සහයෝගය සහිතව දේශපාලන බලය දිනා ගනු වස්, ධනේශ්වරයේ සියලු ම කන්ඩායම්වලින් මුලුමනින් ම ස්වාධීනව, කම්කරු පන්තිය උගන්වා ගැනීම, සංවිධානය කිරීම හා බලමුලු ගැන්වීම පිනිස ය. ලෙනින්ගේ හා ට්‍රොට්ස්කිගේ නායකත්වය යටතේ බොල්ෂේවික් පක්ෂය විසින් ඔක්තෝබර් විප්ලවයේ දී සාක්ෂාත් කර ගැනුනේ මෙම ඉදිරිදර්ශනය යි.

"ලසසප 1953න් පසුව එහි පරිපූර්න විරුද්ධ මාවත ගත්තේ ය. එය සොලමන් බන්ඩාරනායකගේ ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමග නිතරඟ ගිවිසුමක් අත්සන් කල අතර එමගින් ඔහුගේ පක්ෂය 1956 දී බලයට ගෙන ආවේ ය. ලසසප ධනපති පර්යාය තුල කීකරු පාර්ලිමේන්තු විපාර්ශ්වයක් ලෙස ක්‍රියා කලේ ය. මෙම ජාතික අවස්ථාවාදී මාවතේ ගිය ලසසප නතර වූයේ 1964 දී සිරිමා බන්ඩාරනායක මැතිනියගේ ආන්ඩුවට එක්වීමෙනි. ලසසප ට්‍රොට්ස්කිවාදී මූලධර්ම හා කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය පාවා දීම සිදු කලේ, කම්කරු පන්තිය යලි වතාවක් ආන්ඩුවට එරෙහිව ප්‍රධාන ගැටුමකට සූදානම් වෙමින් සිටි තතු තුල ය. ඉල්ලීම් 21 ව්‍යාපාරය වාර්ගික රේඛා කපා ගෙන කම්කරුවන්ගේ සියලු කොටස් ඒකාබද්ධ කර තිබුනි. රටේ තත්වය පාලනය කල නොහැකි මට්ටමකට එලඹ ඇතැයි අගමැති බන්ඩාරනායක ප්‍රසිද්ධියේ පිලිගත්තා ය. ඇගේ ආන්ඩුවට ලසසප ඇතුලුවීම හුදෙක් ශ්‍රී ලංකාවේ පමනක් නොව, කලාපය පුරා ම, කම්කරු පන්තිය සඳහා ව්‍යසනකාරී දේශපාලන ප්‍රතිවිපාක ගෙන ආවේ ය.

"දැන් අප සෝවියට් සංගමය පිලිබඳ නෝර්ත්ගේ ප්‍රශ්නය යලි සකස් කොට ඉදිරිපත් කල හොත්, අපට මෙසේ ඇසිය හැකි යඃ ලසසප 1964 දී වෙනස් පිලිවෙතක් අනුගමනය කොට කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා අරගලය අතහැර දැම්මේ නැති නම්, අර්ථභාරී ලෙස වෙනස් ඓතිහාසික ප්‍රතිඵලයක් ඇති විය හැකිව නොතිබුනේ ද? එය පාලක ප්‍රභූවේ වාර්ගික දේශපාලනය කපා ගෙන ගොස් දකුනේ ජවිපෙ සහ උතුරේ එල්ටීටීඊය වැනි සුලු ධනේශ්වර ස්වෝත්තමවාදී සංවිධානවල පැන නැගීම වැලැක්විය හැකිව නොතිබුනේ ද? පශ්චාත් යුද කාලීන ධනේශ්වර ලෝක පර්යාය තුල පිපිරීම් රේඛා මතු වීම දැනටමත් ආරම්භ වී ඇති තතු යටතේ එය කම්කරුවන්ගේ බලය ගොඩනැගීමේ සැබෑ හැකියාව නිර්මානය කල හැකිව නොතිබුනේ ද?

"මේවා කල්පිත ප්‍රශ්න නොවේ. ලසසපයේ පන්ති සහයෝගිතා පිලිවෙත්වලට විකල්පයක් පැවතුනි. ලසසප ට්‍රොට්ස්කිවාදී හතර වන ජාත්‍යන්තරයේ ශාඛාවක් බව කියා පෑවත්, එය, නොනවතින විප්ලවය න්‍යාය ඇතුලු ට්‍රොට්ස්කිවාදී ක්‍රියාමාර්ගය අතහැර දමා තිබූ පැබ්ලෝවාදී සංශෝධනවාදීන්ට එරෙහිව 1953 සිට අරගලයක් ගෙන ගිය හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට එක්වීම ප්‍රතික්ෂේප කර තිබුනි. පැබ්ලෝවාදී සංශෝධනවාදය ලසසපයට හා එහි ජාතිකවාදී හැඩගැස්මට හොඳින් ගැලපුනි. පසුගිය 44 වසරෙහි මිනිය නොහැකි සමාජ ව්‍යසනය සඳහා වගකිව යුතු ධනපති පන්ත පාලනයෙහි උපාංගයක් බවට ලසසප පත්වීමත් සමග, එහි සිදුවූ දේශපාලන පල්ලම් බැසීමේ දී ලසසපයට පැබ්ලෝවාදීන්ගෙන් සෑම දිරිගැන්වීමක් ම ලැබුනි."

සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය 1968 දී පිහිටුවන ලද්දේ, ශ්‍රී ලංකාව සහ කලාපය පුරා කම්කරු පන්තිය තුල ට්‍රොට්ස්කිවාදය පුනර්ජීවනය කරනු වස් සටන් වදිනු පිනිස බව ඩයස් පැහැදිලි කලේ ය. වත්මන් පරම්පරාව දේශපාලනිකව සන්නද්ධ කරනු පිනිස නෝර්ත්ගේ රචනාව තුල ඉදිරිපත් කෙරුනු ඓතිහාසික පැහැදිලි කිරීම්වල පවත්නා වැදගත්කම යලි අවධාරනය කරමින් ඔහු සිය කතාව සමාප්ත කලේ ය. "සමාජයේ සමාජවාදී පරිවර්තනය සඳහා වන මාවත අලෝකමත් කරන ඓතිහාසික දිශාමානයන්ගෙන් තොර වූ කල, ලොව පුරා වැඩ කරන ජනතාව සහ තරුනයන් මුහුන දෙන වත්මන් ව්‍යසනයෙන් ගොඩ එන ප්‍රගතිශීලී මාවතක් සොයා ගැනීම කල නොහැකි වනු ඇත." යයි ඩයස් පැවසී ය.

ඉන් පසුව පැවති සාකච්ඡාව තුල දී, වර්ගෝත්තමවාදී ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) සාමාජිකයන් වන භික්ෂූන් දෙදෙනෙක් සහ ගිහි සිසුවෙක්, අපසරනයක් නිර්මානය කිරීමේ උත්සාහයක යෙදුනි. හෙල උරුමයේ ක්‍රිස්තියානි විරෝධී ප්‍රචන්ඩ උද්ඝෝෂනය සඳහා සහයෝගය රැලි කර ගනු වස්, එක් භික්ෂුවක් කතිකයාට චෝදනා කලේ, රුසියාවේ රාජාන්ඩුවට සහයෝගය දීමේ ක්‍රිස්තියානි පල්ලියේ ක්‍රියාකලාපය සඳහන් නොකල බව යි. ශ්‍රී ලංකාව තුල සමාජවාදී විප්ලවයේ හැකියාව ප්‍රතික්ෂේප කිරීමේ උත්සාහයක් ලෙස ඔහු අවධාරනය කලේ, රුසියාවේ සමාජ කොන්දේසි අද ශ්‍රී ලංකාවේ පවත්නා ඕනෑම තත්වයකට වඩා අතිශයින් නරක තත්වයක පැවති බව යි.

පිලිතුරු දීමේ දී, ඩයස් පෙන්වා දුන්නේ, පැරනි රුසියාවේ ක්‍රිස්තියානි පල්ලිය, කොලඹ පාලක සංස්ථාපිතයට සහයෝගය දෙමින්, සිංහල ස්වෝත්තමවාදය ප්‍රචාරය කරමින් හා දෙමල සුලුතරයට එරෙහි රාජපක්ෂ ආන්ඩුවේ ප්‍රතිගාමී යුද්ධයට සහයෝගය දෙමින්, අද ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්ථාපිතය මෙන් ම දුෂ්ට ක්‍රියාකලාපයක් ඉටු කල බවයි. සමාජ කොන්දේසි සම්බන්ධයෙන් ඔහු පෙන්වා දුන්නේ, උතුරේ යුද්ධය සහ දකුනේ ලේවැකි මර්දනයන් හේතු කොට ගෙන පසුගිය දශක දෙකක කාලය තුල 200,000කට වැඩි ජන සංඛ්‍යාවක් ඝාතනය කෙරී ඇති බව යි. තවත් 400,000ක් සිය නිවාස හා ඉඩම්වලින් අවතැන් කරනු ලැබ ජරාජීර්න සරනගත කඳවුරු තුල කුනුවීමට අතහැර දමනු ලැබ ඇත. සමස්තයක් වසයෙන් ගත් කල, මෙය දිවයිනේ ජනගහනයෙන් සියයට 3කට ආසන්න ප්‍රමානයකි.

මූලික ආහාර ද්‍රව්‍ය සඳහා උද්ධමනය සියයට 40කට අධික මට්ටමකින් පවතින තතු යටතේ, නගරබද හා ගම්බද වැඩ කරන ජනතාව මුහුන දෙන ඉවසිය නොහැකි ආර්ථික බර බද්දල් ඩයස් විස්තර කලේ ය. අහිංසක දායකයන්ගෙන් ඔවුන්ට දිගට ම දානමානාදිය ලැබෙන බැවින් බෞද්ධ භික්ෂූන්ට මෙම අසීරු කොන්දේසි නොදැනෙනවා විය හැකි මුත්, ඒවා වැඩ කරන ජනතාව ධනවාදයට විකල්පයක් සෙවීම පිනිස තල්ලු කරන බව, ඩයස් පැවසී ය. මේ අවස්ථාවේ දී, හෙල උරුමයේ ආධාරකරුවෝ කතිකයා හෙලා දැකීමටත් සහයෝගය පතා ආයාචනය කිරීමටත් මැදිහත් වූ නමුත්, තමන් මුලුමනින් ම හුදකලා වී ඇති බව දැන ගැනීමෙන් පසුව ඔවුන්ට පසුබැසීමට බල කෙරුනි. සභාවේ සිටි අය ගනනාවක් ම ඔවුන්ගේ හැසිරීමට විරුද්ධව නැඟී සිටියේ ය.

සිසුන් බොහෝ දෙනෙක් සසජාශි සහ සසප සාමාජිකයන් සමග කතා කරනු පිනිස රැස්වීමෙන් පසුව රැඳී සිටියේ ය. ඔවුහු කම්කරු පන්තියේ ඓතිහාසික අත්දැකීම් පිලිබඳව තව දුරටත් දැනගැනීමේ ආශාවත් සමාජවාදී විකල්පයක් සඳහා අරගලය ගැන උනන්දුවත් ප්‍රකාශයට පත් කලහ. ගනනාවක් ම, දේශපාලන සාකච්ඡාවක් වලකනු වස් හෙල උරුමය හා සෙසු ස්වෝත්තමවාදීන් යොදා ගත් ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම හෙලා දැක්ක අතර මීට වසරකට ඉහත දී එම විශ්වවිද්‍යාලයේ දී ම සසජාශි සංවිධානය කල පොත් ප්‍රදර්ශනයක් කඩාකප්පල් කිරීමට ජවිපෙ මැරයන් ක්‍රියා කල ආකාරය ද මතක් කලේ ය.

© www.wsws.org